සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභා චක්‍රලේඛ ලිපි අංක 34/ 2026

මගේ අංකය- PPSC/ES/07/FI/2/3/13
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා කාර්යාල සංකීර්ණය
නව නගරය - රත්නපුර.
2026.09. 11

සබරගමුව පළාත් සභාවේ.
01. ප්‍රධාන ලේකම්
02 ලේකම්,ප්‍රධාන අමාත්‍යාංශය
03. පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව
04. සහකාර පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,රත්නපුර/කෑගල්ල

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් පාලන කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.**

සබරගමුව පළාත් රාජ්‍ය සේවයට අනුමත පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් පාලන කොමසාරිස්(දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ පරිපාටියට අනුව පුරප්පාඩුව පවත්නා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් පාලන කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියේ තනතුර (01) සඳහා පහත සුදුසුකම් සපුරා ඇති සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන්ගෙන් සහ ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. අයදුම් කිරීමට තිබිය යුතු සුදුසුකම්**

I. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු හෝ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරියෙකු වීම.

හෝ

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් පාලන කොමසාරිස්(දෙපාර්තමේන්ත්තුගත) තනතුරට බඳවා ගැනීමේ පරිපාටියෙහි අන්තර්කාලීන විධිවිධාන යටතේ බඳවා ගන්නා අවස්ථාවක, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු හෝ විමර්ශන නිලධාරියෙකු ලෙස වසර 10 ක පළපුරුද්දක් සහිත MN 4 හා MN 5 වැටුප් කාණ්ඩයේ I ශ්‍රේණියේ විමර්ශන නිලධාරියෙකු හෝ I ශ්රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු වීම.

II. සෑම අපේක්ෂකයෙකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයට අදාළ වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

IV. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර (05) ක කාලය තුල කිසිදු විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නැති නිලධාරියෙකු විය යුතුය.

**03. බඳවා ගැනීමේ ක්‍රමය**

නියමිත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් ලිඛිත විභාගයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයේදී එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින් ලැබූ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරන අතර මේ සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරයි.

එක් අයදුම්කරුවෙකු පමණක් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ලිඛිත විභාගය පැවැත්වීම වෙනුවට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබයි.

04. ලිඛිත විභාගයේ දී එක් එක් විෂයය සඳහා අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත් අයදුම්කරුවන්ගේ ලකුණුවල මුළු එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කරන අවස්ථාවකදී අයදුම්කරු අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලකුණු ලබාගත්තේනම්, පුරප්පාඩුව ඇති සහකාර පළාත් පාලන කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගනු ලබයි.

ලිඛිත විභාගයේ විෂය නිර්දේශය පහතින් දක්වා ඇත.

| විෂය අංකය | විෂයයන් | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | පළාත් පාලන විෂය ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ අභියෝගාතාවය | ගැටළු සහ ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාවය,ස්වයං විනය ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයන්ට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාවය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.<br>(මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, ව්‍යුහගත හා රචනා ප්‍රශ්න වලින් සමන්විත වේ.) | පැය 03 | 100 |
| 02 | සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක , භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාවය. තාර්කික අවබෝධය.අර්ථකථන හැකියාව වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.<br>(මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.) | පැය 01 | 100 |

05. මීට අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව තම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා (තම පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතනයේ ප්‍රධානියා) මඟින් **2026.09.30** දිනට ප්‍රථම ලැබෙන පරිදි පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත එවිය යුතුය.

06. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු, නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතනයේ ප්‍රධානියා විසින් නිවැරදිදැයි පරීක්ෂා කර බලා සහතික කර තම නිර්දේශ සඳහන් කරමින් මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය.

07. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපිය මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අදාල නිලධාරින්ගේ දැනගැනීම සඳහා යොමු කරන ලෙස දන්වමි.

08. මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වන අවසාන තීරණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් තීරණය කරනු ඇත.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහකාර පළාත් පාලන කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය</u>**

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :-.......................................................................

(ii) මුලකුරු සමඟ නම :-...........................................................................

02. (i) දැනට දරණ තනතුර හා ශ්‍රේණිය :-.....................................................................

(ii) දැනට දරණ තනතුරට පත්වූ දිනය :- ...........................................................

(iii) 2026.09.30 දිනට එම තනතුරේ සේවා කාලය :- අවුරුදු ☐ මාස ☐ දින ☐

03. උපන් දිනය :- වර්ෂය ☐ මාසය ☐ දිනය ☐

04. (අ) ලිපිනය

(i) රාජකාරී :-...........................................................................................

(ii) පෞද්ගලික :-...........................................................................................

(ආ) පෞද්ගලික දුරකතන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු හෝ විමර්ශන නිලධාරියෙකු ලෙස වසර 10 ක පළපුරුද්දක් සහිත,ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරියෙකු හෝ ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කර තිබේද යන්න :- ..............................................

හෝ

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු හෝ විමර්ශන නිලධාරියෙකු ලෙස වසර 10 ක පළපුරුද්දක් සහිත I ශ්‍රේණියේ ප්‍රජා සංවර්ධන නිලධාරීයෙකු හෝ I ශ්‍රේණියේ විමර්ශන නිලධාරියෙකු ලෙස සේවය කර තිබේද යන්න (අන්තර්කාලීන විධිවිධාන බලාත්මක වන අවස්ථාවක) ....................................................

06. සබරගමුව පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වී ඇත්නම් එම දිනය:..........................................

07. 2026.09.30 දිනට පූර්වාසන්නයෙන් වූ වසර 05 ක කාලය තුළදී යෙදුන වැටුප් වර්ධක උපයා ගෙන තිබේද.......................................................

උපයා ගෙන නොමැත්තේනම් හේතු මොනවාද?.........................................................................

...........................................................................................................................

08. 2026.09.30 දිනට පූර්වාසන්නයෙන් වූ වසර 05 ක කාලය තුලදී විනයානුකූල දඬුවමක් ලබා තිබේද?................................

විනයානුකූල දඬුවමක් ලබා තිබේ නම් හේතු මොනවාද?

.................................................................................................................................................................

.................................................................................................................................................................

09. සේවා කාලය තුලදී ලබා ඇති දඬුවම් කිසිවක් වේ නම්, සිදුකල වරද, ලබා දුන් දඬුවම් හා දඬුවම් නියම කළ දිනය ආදි තොරතුරු කෙටියෙන් සඳහන් කරන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

10. වැටුප් රහිත හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේද?.................................

11. මෙම අයදුම්පත්‍රයේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව තහවුරු කරමි. තවද මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය :- ............................................ ............................................................

විභාග අපේක්ෂකයාගේ /අපේක්ෂිකාවගේ අත්සන

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන**

ඉහත අංක 01 සිට 10 දක්වා වූ තොරතුරු නිවැරදි බවත් මෙම අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම තනතුර සඳහා අයදුම්කිරිමට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය :- ...................................... ......................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)